තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදී ය.

**ජේ.එම්.බී.ජයවර්ධන එ. ප්‍රධාන ලේකම් කාර්යාලය, බස්නාහිර පළාත**

**RTIC Appeal (ලේඛනගත කාර්යපටිපාටිය) 03/2018 (2018.03.02 දින පැවති කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය)**

**2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවතවාගෙන යනු ලබන කාර්ය පටිපාටිය.**

**සභාපති** - මහින්ද ගම්මම්පිල මහතා
**කොමිෂන් සභා සාමාජික** - ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා මහතා
**කොමිෂන් සභා සාමාජික** - ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍ර මිය
**අධ්‍යක්ෂ-ජනරාල්** - පියතිස්ස රණසිංහ මහතා

**අභියාචක** - ජේ.එම්.බී.ජයවර්ධන මිය
**නොතීසිලත්පාර්ශවය** - ප්‍රදීප් යසරත්න මහතා, ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය.

| | |
|---|---|
| **තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය:** | 2017.06.29 |
| **තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය:** | 2017.06.29 (ලැබුණු බව දැන්වීම)<br>2017.07.06 |
| **නම්කළ නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය:** | 2017.07.28 |
| **නම්කළ නිලධාරියා තීරණය ලබා දුන් දිනය:** | 2017.08.14 |
| RTIC **කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය:** | 2017.10.13 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**
අභියාචක 2017.06.29 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු විමසා ඇත.
*නීතිපතිගේ අංක SCCA/283/2015 සහ 2016.3.23 ලිපියේ සහතික පිටපතක් ලබාගැනීම*

තොරතුරු නිලධාරියා 2017.07.06 දිනැතිව පිළිතුරු දෙමින් සඳහන් කර ඇත්තේ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 (ඊ) වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කර ඇත. තොරතුරු නිලධාරියාගේ තීරණයෙන් සෑහීමකට පත් නොවීම හේතුවෙන් අභියාචක 2017.07.28දිනැතිව නම්කළ නිලධාරියා වෙත අභියාචනයක් යොමුකර ඇත. ඉන්අනතුරුව නම්කළ නිලධාරියා 2017.08.14 දිනැතිව පිළිතුරුදෙමින් තොරතුරු නිලධාරියාගේ තීරණය ස්ථිර කරමින් තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත.

නම්කළ නිලධාරියාගේ තීරණයෙන් සෑහීමකට පත් නොවීම හේතුවෙන් අභියාචක 2017.10.13 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකර ඇත.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදී ය.

**අභියාචනය විභාග කිරීමේ අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

මෙම කොමිෂන් සභාවේ 2018.02.16 දිනැති නොතීසිවලට ප්‍රතිචාර දක්වමින් පොදු අධිකාරිය 2018.02.23 දිනැතිව කොමිෂන් සභාවට ලිඛිත දේශනා යොමු කර ඇත. එම ලිඛිත දේශනා සමඟ කොමිෂන් සභාවේ නිරීක්ෂණයට තොරතුරු ඉල්ලීම පාදක කරගත් ලිපියද අමුණා ඉදිරිපත් කර තිබුණි.

**නියෝගය**

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 (1) (ඊ) වන වගන්තිය පහත පරිදි දක්වා ඇත.

5. (1) *පනතේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව -*
*පොදු අධිකාරියට සේවා සැපයීමේදී නීතිපතිවරයා හෝ නීතිපතිවරයාට සහාය දක්වන යම් නිලධරයෙකු සහ පොදු අධිකාරීන් අතර පවතින යම් සන්නිවේදනයක් ඇතුළුව, යම් ලිඛිත නීතියක් යටතේ හෙළිදරව් කිරීම සඳහා අවසර දී නොමැති වූ, වෘත්තීකයන් සහ එම වෘත්තිකයන් විසින් සේවා සපයනු ලබන යම් පොදු අධිකාරියක් අතර පවතින යම් සන්නිවේදනයක සංයුක්ත වන්නා වූ තොරතුරක් වන අවස්ථාවකදී*
*මේ පනත යටතේ ඒ තොරතුරුවලට ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කළ හැකිය.*

මෙම අභියාචනයේ කරුණු සළකා බැලීමෙන් අනතුරුව පෙනී යන්නේ, තොරතුරු ඉල්ලීමෙන් විමසා ඇති ලිපිය, පනතේ ඉහත දක්වා ඇති 5 (1) (ඊ) වන වගන්තිය යටතට ගැනෙන සන්නිවේදනයක් වන බවයි.

ඒ අනුව නම් කළ නිලධාරියාගේ තීරණය ස්ථිර කරමින් තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට කොමිෂන් සභාව තීරණය කර සිටියි.

අභියාචනය මෙයින් අවසන් කරනු ලැබේ.
****